# නෙතට රසඳුනක් වූ - හෙළ දරු වරුණ

**Photographs - Bandula Manage**
**බන්දුල මානගේ ( SESATHA WEB සේසත )**









Asiri Bandara ආසිරි බණ්ඩාර



**වි**දේශ රටවල ඉපිද හැදෙන වැඩෙන ශ්‍රීලාංකික දරුවන්ට සිය මව්බස හා මව්බිමේ සංස්කෘතික හැදියාවන් ප්‍රගුණ කරවීමේ උතුම් කාර්යයක් ලෙස පසු ගිය අප්‍රියෙල් මස 21 වන සෙනසුරාදා බටහිර ලන්ඩනයේ හවුන්ස්ලෝහි ලැම්ප්ටන් පාසැල් ශාලාවේ දී කරළියට ගෙන ආ **හෙළ දරු වරුණ** නම් ආශ්වාදජනක ප්‍රසංගය නැරඹූ මම පසක් කළෙමි. එහි අගය වඩාත් තීව්‍ර වන්නේ ඒ ප්‍රසංගයේ ආරම්භයේ සිට අවසාන මොහොත දක්වා බිඳකුදු විඩාව කින් තොරව ප්‍රීතිමත් සිතින් එය නරඹන්නට හැකිවීමත්, එකද ඉංග්‍රීසි වදනක් මිශ්‍ර නොකොට චතුර ලෙස සිංහල බස හසුරුවමින් ඒ දරුදැරියන් විසින්ම කථනය කරනු ලබමින් නර්තන ගැයුම්, වන්නම්, කස්තිරම් ඈ සියල්ල මනාසේ වේදිකාවට ගෙන ඒමයි.

විදේශගතවූ පමණින් තම මව්බිමට ආවේණික සියළු ගති පැවතුම් මුළුමනින් හැරදමා, බටහිර ක්‍රමවේද වැළඳගෙන, අද නමට පමණක් සිංහල වී සිටින .සිංහළ. දෙමව්පියන්ද, .සිංහළ. දරුවන්ද, මේ එක්සත් රාජධානියේ සිංහල ජනකොට්ඨාශය අතර අපට අනන්තවත් මුණගැසේ. එහෙත් ඒ අතර අතළොස්සක් වුවද දෙමව්පියන් බටහිර සිටියද, එයට ගැත්තන් නොවී, සිය සිංහළකම සහ සිංහල හැදියාව අනුව ජීවත්වෙමින්, මෙහි උපන් සිය දරුවන් ද ඒ මඟෙහිම ගෙනයනු දැක්ම ඇත්තෙන් ම ප්‍රශංසනීය ය. ගරු නම්බු ලැබිය යුත්තෝ, පිදුම් ලැබිය යුත්තෝ ඒ දෙමව්පියෝ වෙති. මේ හේතුව තුළ ඇත්තේ අන් කිසිවක් නොව ඔවුන් මනසින් හදවතින් සැබෑ සිංහළයින් වීමයි. තම දරුවන් මෙවැනි කාර්යයකට යොමුකරවන්නට සිත් දෙන්නේ ද ඒ සිංහළකම කොයි දීපංකරේ ගියද ඔවුන් සිත්හි නොනැසී නොනිමී දැල්වෙන බැවිනි.

භාෂාව හා සංස්කෘතිය යනු ඕනෑම ජාතියක් වඳ නොවී නොනැසී ලොව පවතින්නට උපකාරී වන අංගයන් දෙකකි. එය ජාතියක ජීවනාලිය හා පිට කොන්ද ද වේ. ඒ ද්විගුණයෙන් කිසියම් ජාතියක් තොරවෙත්ද ඒ ජාතිය මිහිපිට සිටිය ද කිසිදු වටිනා කමක් නැති මැටිගුලියක් හා සමාන වන්නේ ය. මැටි පිඩක කුමන බැබලීමක් ද?

වසර තුනක්ම ලන්ඩනයේ පමණක් වේදිකා ගත කළ මෙම හෙළදරුවරුණ ප්‍රසංගය යුරෝපයේ අනෙක් රටවලට ද ගෙනගොස් පෙන්විය හැකිනම් කොතරම් අගේ දැයි මට එදා මෙය නරඹද්දී සිතට නැගිණ. මෙය එතරම් අගනා දැක්මකි. සැබැවින්ම මේ දරු-වෝ ලොයි කොයි දෙස වුවද වෙසෙන විශේෂයෙන් ලංකාවේ වර්තමානයේ වෙසෙන සිංහළ දරුවන් අභිබවා ඉදිරියට පැමිණ ඇති බවක් ඉතා පැහැදිලිව දැකිය හැකිය.

හෙළදරු වරුණ මාහැඟි ප්‍රසංගය කිසිදු ලාභාපේක්ෂාවකින් තොරව අතිශය කැපවීමකින් හා මහන්සියෙන් යුතුව සංවිධානය කරමින් වේදිකාවට ගෙන ඒමම විෂ්මයජනක කාර්යයකි. එම මූලික අදහස සිත්හි උපදවාගෙන එය ඉතා සාර්ථක ප්‍රසංගයක් ලෙසට නිමැවූ කලාකාමී තරුණයා - ආසිරි බණ්ඩාරයන් ප්‍රමුඛ ඒ විශිෂ්ඨ දේශප්‍රේමී සංවිධායක මණ්ඩලයට ද ප්‍රසංගය ආලෝකමත් කළ ඒ සුන්දර දරුදැරියනට ද අප කාගේත් ප්‍රණාමය නිසැකවම හිමිවිය යුතු බව කියමි.

♦ වෙනුර




HolidayAir A Travel Experience to Remember
The No.1 Agent to Sri Lanka
Do not book your Air Ticket with any other travel agent until you speak to us!
Best Value Deals to Colombo

SriLankan
CASH PLUS MILES OFFER
£180 + 12,000 miles + taxes
£200 + 8,000 miles + taxes
TRAVEL DATES
LONDON – COLOMBO FROM 05 APR – 30 JUN'12
COLOMBO – LONDON FROM 22 APR – 15 JUL'12
Seats subject to availability.



Flights to Sri Lanka on SriLankan
We will not be beaten on Price!
That's a promise!
If you find a cheaper quote from
Any agent
Any day
Any class
WE WILL DOUBLE THE DIFFERENCE!

JET AIRWAYS £175 +Taxes 10th – 31st May 2012
OMAN AIR £215 +Taxes 10th – 31st May 2012
KUWAIT AIRWAYS £225 +Taxes 10th – 31st May 2012
QATAR AIRWAYS £300 +Taxes 10th – 31st May 2012
ETIHAD £305 +Taxes 10th – 31st May 2012
SriLankan £310 +Taxes 10th – 31st May 2012
GULF AIR £385 +Taxes 10th – 31st May 2012
Emirates £405 +Taxes 10th – 31st May 2012

Terms and conditions apply.

0208 440 0770 www.holidayair.com
96 High Street, Barnet, Herts EN5 5SN Open 6 days - Mon-Fri 9.00am-6.00pm, Sat 9.30am-5.30pm
Skype us on holiday.air
facebook Holidayair Holidays
ATOL PROTECTED IATA MCG